# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2492/10 - 2026 ජුනි මස 09 වැනි අඟහරුවාදා - 2026.06.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1) (ඇ) වගන්තිය සහ VI වන කොටස සමග කියවිය යුතු 105 වගන්තිය යටතේ සකස් කළ රීතින්.

**පී. නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2026 ජුනි මස 09 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

1. මෙම රීති "2026 අංක 02 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙම රීති පාර්ලිමේන්තුව විසින් අනුමත කල දිනයේ සිට බලපැවැත්වේ.

2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, 2026 ජනවාරි 30 දිනැති අංක 2473/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලද 2026 අංක 1 දරන රීතිය මගින් සංශෝධනය කරන ලද, 2024 ජූලි 01 දිනැති අංක 2391/02 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීතිය, පහත පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.


1A - G 46794 — 354 (2026/06)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(අ) එහි 4 වන රීතිය අවලංගු කර පහත දැක්වෙන නව රීති ඒ සඳහා ආදේශ කරනු ලැබේ.**

"4. ඉහත 3 රීතියට අනුව, ඕනෑම මසක් තුළ, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළැඹෙන මාසයේ දහවන (10) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල් බවට අනිවාර්යෙන්ම පරිවර්තනය කළ යුතු ය.

(i) එක් මසක වගකීම් ද ඇතුළුව අපනයන ව්‍යාපාරයට අදාළ ජංගම ගනුදෙනු සඳහා වන ගෙවීම්;

(ii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව, එක් මසක වගකීම් ද ඇතුළුව භාණ්ඩ අපනයනකරුවන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික ගෙවීම්;

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි අනේවාසික ආයෝජකයින්ට ප්‍රකාශිත ලාභාංශ ගෙවීම් සහ/හෝ විදේශීය ජාතිකයින් හෝ ද්විත්ව පුරවැසියන් වන ප්‍රවාසික සේවකයින්ට වැටුප් ගෙවීම්;

(iv) අපනයන ව්‍යාපාරයට අදාළ සංචාරක අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ අරමුදල් මාරු කිරීම්;

(v) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන විදේශ මුදල්වලින් නම් කරන ලද ණය සුරැකුම්පත්වල ආයෝජනය සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%), දක්වා සිදු කරන ගෙවීම්; සහ

(vi) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන අනුව නිකුත් කරන ලද විධානයන් යටතේ අවසරලත්, විදේශ මුදලින් වගකීම් ඇති වක්‍ර භාණ්ඩ හා සේවා අපනයනකරුවන්ට සිදු කරන ගෙවීම්."

**(ආ) එහි 6 වන රීතිය අවලංගු කර පහත දැක්වෙන නව රීති ඒ සඳහා ආදේශ කරනු ලැබේ.**

"6. ඉහත 4 (vi) වන රීතිය ප්‍රකාර ව, ඕනෑම මසක් තුළ, අපනයන ඉපැයීමකින් විදේශ මුදලින් ගෙවීම් ලබන සෑම වක්‍ර භාණ්ඩ හා සේවා අපනයනකරුවෙකුම, එසේ ලැබෙන ආදායමෙන්, ඉහත 4 (i) සිට (v) වන රීතින් යටතේ සඳහන් කර ඇති අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළැඹෙන මාසයේ දහවන (10) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු ය."

EOG 06 - 0079

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.